සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# පළමුවාර අවසාන ඇගයීම
# First term End Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

* **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* **II** කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I කොටස

❖ **අංක 01 සිට 20 දක්වා සියලු ම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) අපේ පැරණි ජනතාවගේ ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස තෝරාගත්තේ,
(1) හේන් ගොවිතැනයි. (2) කෘෂිකර්මාන්තයයි.
(3) වෙළඳාමයි. (4) සත්ත්ව පාලනයයි.

(02) නවදැලි හේනක් නමින් හඳුන්වන්නේ,
(1) උදු වැපිරීම සඳහා සකස් කළ බිමයි. (2) සරුසාර ගොවිබිමයි.
(3) ගිනිතබා අලුතින් සකස් කළ ගොවි බිමයි. (4) වනාන්තරයක් ආසන්නයේ පිහිටි පාළු බිමයි.

(03) කුඹුරුවල මැස්සන් මර්දනය කිරීම සඳහා යොදාගත් පහන්වලට පැරැන්නන් භාවිතා කර ඇත්තේ,
(1) පොල් පිති හා පොල්තෙල් ය. (2) කොහොඹ කෝටු හා කොහොඹ තෙල් ය.
(3) කඳුරු කෝටු හා මීතෙල් ය. (4) පොල් ඉරටු හා කොහොඹ තෙල් ය.

(04) පැරණි සමාජයේ ප්‍රචලිතව පැවති සත්ත්ව පාලන ක්‍රමය වූයේ,
(1) ගව පාලනය ය. (2) එළු පාලනය ය.
(3) කුකුළු පාලනය ය. (4) ඌරු පාලනය ය.

(05) අතීතයේ පැවති දොරමඩලා ග්‍රාමය
(1) කසීකාර ගමකි. (2) ගෝපාල ගමකි.
(3) පේෂකාර ගමකි. (4) කුම්බකාර ගමකි.

(06) මයිනහම උපයෝගී කරගෙන ඇත්තේ කුමන කර්මාන්තය සඳහා ද?
(1) යකඩ කර්මාන්තයට (2) රෙදි කර්මාන්තයට
(3) සපත්තු කර්මාන්තයට (4) මැටි කර්මාන්තයට

(07) රුවන්මැලි සෑය අලංකාර කිරීම සඳහා රෝමයෙන් පබළු ගෙන්වා ඇත්තේ කුමන රජු ද?
(1) දුටුගැමුණු (2) වළගම්බා (3) මහසෙන් (4) භාතිකාභය

(08) තම දියණිවරුන් ආහාර පිසීමේ දක්ෂයින් කිරීමේ වගකීම දෙමාපියන් සතු බවට තොරතුරු සපයන පැරණි ග්‍රන්ථය කුමක් ද?

(1) මහාවංසය (2) සහස්සවත්ථුපකරණය
(3) සිහලවත්ථු (4) බුත්සරණ

(09) අතීත සමාජයේ පැවති විවාහය පිළිබඳ නොගැළපෙන පිළිතුර තෝරන්න.

(1) දෙමාපියන්ගේ ආශිර්වාදය ලබාගත යුතු ය.
(2) සිරිත් විරිත්වලට මුල්තැන දිය යුතු ය.
(3) පෙළපතට ගැළපෙන විවාහයක් විය යුතු ය.
(4) තම කැමැත්තට මුල්තැන දී විවාහය කළ යුතු ය.

(10) අතීත සමාජයේ සිරිත් විරිත් හා සාරධර්ම තුළින් වර්තමානයට ගත හැකි හොඳම ආදර්ශය මින් කුමක් ද?

(1) වැඩිහිටියන්ට සැලකීම (2) හදිසියක දී මිල මුදල් පරිත්‍යාග කිරීම
(3) අවමංගල්‍යවල දී උදව් කිරීම (4) සහජීවනයෙන් කටයුතු කිරීම

(11) දෙවන දාඨෝපතිස්ස රජුගෙන් ආරක්ෂා වීම සඳහා මානවම්ම කුමරු පළාගියේ ඉන්දියාවේ කුමන රාජ්‍යයට ද?

(1) කේරළ (2) පාණ්ඩ්‍ය (3) පල්ලව (4) චෝළ

(12) පළමුවන සේන රජුගේ කාලයේ ලංකාවට ආක්‍රමණයක් එල්ල කළ පාණ්ඩ්‍ය පාලකයා කවුරුන් ද?

(1) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (2) දෙවන නරසිංහවර්මන්
(3) පළමුවන නරසිංහවර්මන් (4) දෙවන වරගුණවර්මන්

(13) දෙවන සේන රජුගේ සේවාවක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රිටිගල පෙත්මග සෑදීම (2) මිහින්තලේ රෝහල කරවීම
(3) රෝගීන්ට දානශාලා පිහිටුවීම (4) ගම් දහයකට වෛද්‍යවරයෙක් පත් කිරීම

(14) මානවම්ම රජ පෙළපත පැවති කාලයේ දැකිය හැකි වූ සුවිශේෂී ලක්ෂණය මින් කුමක් ද?

(1) අභ්‍යන්තර ගැටුම් උග්‍ර වීමයි.
(2) රාජ්‍ය උරුමය නොතකා බලය ලබාගැනීමයි.
(3) පියාගෙන් පුතාට පමණක් රජකම උරුම වීමයි.
(4) පැරණි රාජ්‍ය උරුම ක්‍රමය ක්‍රියාත්මක වීමයි.

(15) දසගම් පාලනය හා අපරාධ නඩු පිළිබඳ නීති රීති ගණනාවක් සහිත සෙල්ලිපිය කුමක් ද?

(1) බදුලු ටැම් ලිපිය (2) මිහින්තලා පුවරු ලිපිය
(3) වේවැල්කැටිය ලිපිය (4) ඉරිපින්තියාව සෙල්ලිපිය

(16) අතීත පාලන සංවිධානය තුළ ඈපා, මාපා වැනි තනතුරුවලට පත්වූයේ,

(1) රජුගේ සේනාපතිවරුන් ය. (3) රාජ්‍ය නිලධාරීන් ය.
(3) රජුගේ පුරෝහිතයන් ය. (4) රජ පවුලේ කුමාරවරුන් ය.

(17) මානවම්ම රජ පෙළපතේ දුර්භාග්‍ය උදාවූයේ කුමන රජුගේ කාලයේ ද?

(1) පස්වන මිහිඳු　　(2) හතරවන මිහිඳු

(3) දෙවන දප්පුල　　(4) නවවන අග්ගබෝධි

(18) පහත දැක්වෙන තොරතුරුවලට අදාළ දකුණු ඉන්දියානු රාජ්‍යය කුමක් ද?

- දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ආශ්‍රිතව පිහිටීම
- මදුරාපුරය එහි අගනුවර වීම
- ලංකාවට ඉතාම ආසන්න වූ දකුණු ඉන්දියානු රාජ්‍යය වීම

(1) චෝළ　　(2) පල්ලව　　(3) පාණ්ඩ්‍ය　　(4) කාලිංග

(19) රාජ රාජ හා රාජේන්ද්‍ර නම් චෝළ පාලකයින්ගේ ආක්‍රමණවලින් බිඳවැටුන ශ්‍රී ලංකාවේ රාජධානිය කුමක් ද?

(1) කෝට්ටේ　　(2) ගම්පොළ　　(3) පොළොන්නරුව　　(4) අනුරාධපුරය

(20) වර්ෂ 53ක පමණ කාලයක් පැවැති චෝළ පාලනයෙන් රජරට මුදාගනු ලැබූ රජතුමා කවුරුන් ද?

(1) නිශ්ශංකමල්ල　　(2) පළමුවන විජයබාහු

(3) දෙවන විජයබාහු　　(4) පළමුවන පරාක්‍රමබාහු

(ලකුණු 2 x 20 = 40

## II කොටස

*** පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
*** අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.**
*** පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර සම්බන්ධව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A



(i) (1) A පින්තූරයෙන් දැක්වෙන කාසියට භාවිතා කළ නම කුමක් ද?

(2) මෙම කාසිය ලැබී ඇති ප්‍රදේශයේ නම සඳහන් කරන්න.

(3) මෙය තැනීමට භාවිතා කර ඇති ලෝහය කුමක් ද?

(4) මෙහි සඳහන් එක් සංකේතයක් සඳහන් කරන්න.

(ලකුණු 02 x 4 = 08)

B



(ii)(1) B පින්තූරයෙන් දැක්වෙන්නේ කුමන කර්මාන්තයක යෙදීම ද?

(2) මෙම කර්මාන්තයේ නියුතු ශිල්පීන් හැඳින්වූ නම කුමක් ද?

(3) මෙහි භාවිතා වෙන උපකරණය කුමක් ද?

(4) මෙම උපකරණය යොදාගෙන නිපදවන භාණ්ඩයක් නම් කරන්න.

(ලකුණු 02 x 4 = 08)

(02) (i) හේන් හැඳින්වීමට භාවිතා කරන නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) හේනක් සකස් කිරීමේ දී අනුගමනය කරන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) හේනක් ආරක්ෂා කර ගැනීමට ගොවියන් කටයුතු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) තෝනිගල සෙල්ලිපියේ සඳහන් වී වගා කරන කන්න දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) කුඹුරක් සකස් කිරීමේ දී ගොවියන් විසින් සිදු කරන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ගොයම ආරක්ෂා කර ගැනීම සඳහා භාවිතා කරන සම්ප්‍රදායික ක්‍රම දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) ගවයාගෙන් ලබාගන්නා පෝෂක ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අතීතයේ පැවති කර්මාන්ත හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) බදුලු ටැම් ලිපිය පිළිබඳ පහත තොරතුරු සපයන්න.

A - එය කරවූ රජතුමා B - එහි සඳහන් වගන්ති දෙකක් (ලකුණු 05)

(05) (i) අතීතයේ අපේ රට සමඟ විදේශ වෙළඳාම සිදු කළ රටවල් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) විදේශ වෙළඳාමේ දී මෙරටින් ගෙන්වන ලද හා මෙරටින් යවන ලද භාණ්ඩ දෙක බැගින් අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) අතීතයේ මෙරට පැවති විදේශ වෙළඳාමේ ස්වභාවය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

(06) (i) පහත දැක්වෙන රජවරුන්ගේ රජ පෙළපත්වල නම් ලියන්න.

a. වසභ රජ b. ධාතුසේන රජ (ලකුණු 02)

(ii) මානවම්ම රජ පෙළපත ආරම්භ වීමට පෙර මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) මානවම්ම රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් සඳහන් කොට ඉන් එකක් පෙන්වූ අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනයේ දී රජුට සහාය වූ නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) රටේ ආරක්ෂාව සැලසීම සඳහා රජු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අතීතයේ රට තුළ නීතිය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)